T

# ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ 12/13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන ආකාරය හා එහි පවත්නා ප්‍රබලතා හා දුබලතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එම්.ඩී.වී.එන්. ගුණතිලක**

විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය (කැලණිය විශ්ව විද්‍යාලය)

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ විශ්ව විද්‍යාලය)

අධ්‍යාපනපති උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය)

UCLIB
545636

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2004/M.Phil/15

2008

## සාරාංශය


සමාජයේ රාශීභූතව පවත්නා ප්‍රඥාව හා ඥානය එක් පරම්පරාවක සිට ඊලඟ පරම්පරාව වෙත සම්ප්‍රේෂණය කිරීමෙන් සමාජයේ අනාගත පුරවැසියන් වනු පිණිස හා සාමාජය පවත්වා ගෙන යාමට නැතහොත් සංවර්ධනයට සක්‍රීය සහභාගීත්වය සඳහා ළමා පෙළ සූදනම් කිරීම අධ්‍යාපනය වන බව ජූලියස් නියරේරේ (1968) ප්‍රකාශ කර තිබේ. ඒ අනුව රටක අධ්‍යාපන අරමුණු ක්‍රියාවලිය මෙන්ම ඇගයීම් ක්‍රියාවලිය ද එයට ගැලපෙන ආකාරයෙන් සැකසී තිබිය යුතුය.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ 12/13 ශ්‍රේණිවල ඉගෙනුම ලබනුයේ වයස අවුරුදු 17-19 අතර පසුවන කායික, මානසික, චිත්තවේගය හා සාමාජීය යන අංශයන්ගේ පිබිදීමකින් යුත් සිසුවෙකි. ඔහුට පාසල් අධ්‍යාපනය අවසන් කර වැඩ ලෝකයට පිවිසීම හෝ තෘතියික අධ්‍යාපනයට පිවිසීමට හෝ සිදුව ඇත. ඔහුගේ නිපුණතා සංවර්ධනය වීමට උචිත අධ්‍යාපන ක්‍රියාවලියක්ද එය මිනීමට උචිත ඇගයීම් ක්‍රියාවලියක්ද ගොඩ නැගීම අත්‍යවශ්‍ය කටුයුත්තකි.

මෑත දශකයේ 12/13 ශ්‍රේණිවල විෂය සංඛ්‍යාව තුන දක්වා අඩු කිරීම විෂයමාලාවේ සිදුවූ වෙනසක් වූ අතර සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රමයට අමතරව පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය හඳුන්වාදීම ඇගයීම් ක්‍රියාවලියේ වෙනසකට හේතුවිය. විකල්ප ඇගයීම් ක්‍රමයක් ලෙස 12/13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය දැනට ක්‍රියාත්මක වන ආකාරය හා එහි ප්‍රබලතා හා දුබලතා විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. එම අරමුණ සුවිශේෂී අරමුණු පහක් ඔස්සේ විමසුමට ලක් කෙරේ. 12/13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළෙහි අරමුණු, ක්‍රියාත්මක වන ආකාරය හා ඒ පිළිබඳ ගුරු භවතුන්ගේ දැනුවත් භාවය අතර සම්බන්ධතාව, අභ්‍යන්තර හා බාහිර නියාමනය සිදුවීම හා පාසල පදනම් කරගත් ඇගයීම් පංති කාමරයේ ක්‍රියාත්මක වන ආකාරය අතර සම්බන්ධතාව, මෙම ඇගයීම් වැඩ පිළිවෙළ පිළිබඳ ගුරු සිසු ආකල්ප විමසීම සුවිශේෂී අරමුණු යටතේ සිදුවේ.

පළමුවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ගැටලුව හා ගැටලුවේ පසුබිම පුළුල් ලෙස විමසුමට භාජනය කර තිබේ. පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය ආරම්භ වීමට පසුබිම වූ කරුණු හා මෙරට එම ඇගයීම් ක්‍රමය ආරම්භ කිරීමට බලපාන ලද සාධක ගැඹුරින් විමසා තිබේ. එසේම විකල්ප ඇගයීම් ක්‍රම හඳුන්වා දීමට ගත් උත්සාහ ව්‍යවර්ථ වූ ආකාරයත්, ක්‍රියාත්මක වෙමින් පවතින 12/13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය සම්බන්ධව ගුරුවරුන්ට හා සිසුන්ට කවර ආකාරයකින් බලපාන්නේද යන්න පිළිබඳවත්, නියාමනය පිළිබඳව විද්‍යමාන වන තත්ත්වයත් සාකච්ඡාවට භාජනය කර ඇත.

දෙවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ගැටලුවට අදාලව කරන ලද පෙර පර්යේෂණ පිළිබඳ සාහිත්‍යය න්‍යායාත්මක විග්‍රහ හා පර්යේෂණ අනාවරණ පදනම් කරගනිමින් විමසා තිබේ. පෙර

සාහිත්‍යය පදනම්ව ගැටලුවේ ස්වභාවය තව දුරටත් විමර්ශනය කර ඇති අතර පර්යේෂණය දියත් කළ යුතු දිශානතිය ඒ අනුව තීරණය කර තිබේ. පර්යේෂණ සාහිත්‍යය පදනම් කර ගනිමින් පර්යේෂණ ක්‍රමවේදය, ජනගහනය, නියැදිය හා දත්ත රැස් කිරීමේ උපකරණ තීරණය කර තිබේ.

තුන්වන පරිච්ඡේදයෙන් විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ රත්නපුර දිස්ත්‍රික්කය ආශ්‍රිත පාසල් 12ක නියැදියක් ද 160කින් යුතු ගුරු නියැදියක් ද 320කින් යුතු සිසු නියැදියක්ද 12කින් යුතු විදුහල්පති නියැදියක්ද 12 දෙනෙකුගෙන් යුතු නියෝජ්‍ය විදුහල්පති නියැදියක්ද, සිව් දෙනෙකුගෙන් යුත් කලාපීය නියාමන භාර අධ්‍යක්ෂවරුන්ගේ නියැදියක්ද, විභාග දෙපාර්තමේන්තු නිලධාරී නියැදියද, තෝරාගත් ආකාරය පැහැදිලි කර තිබේ. එසේම දත්ත රැස් කිරීමේ උපකරණ වන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා නියමාවලි, විධිමත් සම්මුඛ සාකච්ඡා හා ආකල්ප පරීක්ෂණ තනන ලද ආකාරයත්, ලිඛිත මූලාශ්‍ර භාවිත කළ ආකාරයත්, විශ්ලේෂණ ක්‍රම ශිල්ප හා පර්යේෂණ දියත් කළ ආකාරය, පර්යේෂණය සීමා පිළිබඳවද පැහැදිලි කර තිබේ.

හතරවන පරිච්ඡේදයෙන් එක් එක් අරමුණු හා සම්බන්ධව ගොඩ නගා ගත් තේමා ඔස්සේ දත්ත විශ්ලේෂණය කර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන ප්‍රවේශ දෙකම උපයෝගී කර ගන්නා ලදී. මෙහිදී විස්තරාත්මක අර්ථකථනය, ප්‍රතිශතක, ආපතිකතා වගු හා මධ්‍යන්‍යය හා සම්මත අපගමනය යන විශ්ලේෂණ ක්‍රම භාවිතා කර ඇත. එමගින් සිදු කරන ලද විශ්ලේෂණය තුළින් අනාවරණ ඉදිරිපත් කර තිබේ. එම අනාවරණ පදනම් කර ගෙන නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම පස්වන පරිච්ඡේදයෙන් සිදු කර ඇත.

ඒ අනුව 12/13 ශ්‍රේණිවල පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයෙන් අපේක්ෂිත අරමුණු හඳුනාගෙන ඇති ආකාරය, සැලසුම් කර ඇති ආකාරය, ක්‍රියාත්මක වන ආකාරය ආශ්‍රිතව ගැටලු රාශියක් පැන නැගී ඇති බව නිගමන ලෙස ඉදිරිපත් කර තිබේ. පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය ලොව රටවල ආරම්භ කිරීමට හේතු වූ කරුණු පර්යේෂණාත්මක විමසුමට ලක් කොට 12/13 ශ්‍රේණිවල සිසුවාට උචිත පරිදි ඇගයීම් වැඩ පිළිවෙළ නැවත සැකසීම. එම වැඩ පිළිවෙළ නියාමන ව්‍යාපෘතියක් ආශ්‍රිතව ක්‍රියාවට නංවා පසුවිපරමට ලක් කොට ප්‍රබලතා හා දුබලතා හඳුනා ගැනීම, ප්‍රාදේශීය විෂමතා සැලකිල්ලට ගනිමින් ප්‍රතිසංවිධානය කළ වැඩ පිළිවෙළ දියත් කිරීම පිළිබඳව යෝජනා ඉදිරිපත් කර ඇත. ඒ හැරුන විට ගුරුවරුන් සිසුන්, නිලධාරීන් හා සමස්ත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන්, ඇගයීම් ක්‍රියාත්මක කරන ආකාරය හා නියාමනය ප්‍රතිසංවිධානය කළ යුතු ආකාරය පිළිබඳව යෝජනා ඉදිරිපත් කර තිබේ. එසේම මෙම වැඩ පිළිවෙළ ප්‍රතිසංවිධානය කළ යුතු ආකාරය සංකල්ප සිතියමක් ආශ්‍රිතව පැහැදිලි කර ඇත.